**මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016**

**Primary Piriven Year End Term Test - 2016**

**2 වසර /Grade 2**

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**සිංහල**

**SINHALA**

**කාලය : පැය 02 යි.**

**Time : Two hours**

**පළමුවැනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 06කට පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150කට නො අඩු වාක්‍ය රචනයක් ලියන්න.

    i. මහා පරාක්‍රමබාහු මහරජතුමා
    ii. ඉගෙනීමේ අගය වටහා ගනිමු.
    iii. මා ගිය අධ්‍යාපන චාරිකාව.
    iv. ගසක් කතා කරයි.
    v. අවෛරයෙන් වෛරය සංසිඳේ. (ලකුණු 25)

02. අ) වර්ගාන්තාක්ෂර කීයද ? ඒවා පිළිවෙළින් ලියන්න.
    (ලකුණු 05)

    ආ) පහත සඳහන් අකුරුවල ස්වර ව්‍යඤ්ජන වෙන්කරන්න.
    හු, කො, පෘ, සෑ, කී (ලකුණු 05)

    ඇ) පහත සඳහන් වචන අකාරාදී පිළිවෙළට ලියන්න.
    මැණික් ගඟ, නිල්වලා ගඟ, බෙන්තර ගඟ, මහවැලි ගඟ, කළු ගඟ, වලවේ ගඟ, ජය ගඟ, අඹන් ගඟ, ගිං ගඟ, හුළු ගඟ (ලකුණු 05)

03. අ) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

    i. ඡන්දදායකයා / චන්දදායකයා / ඡන්ධදායකයා
    ii. ෂිශ්ටාචාරය / ශිෂ්ටාචාරය / ශිෂ්ඨාචාරය
    iii. සම්බන්ධ / සම්බන්ද / සම්භන්ද
    iv. ප්‍රතිපල / ප්‍රථිඵල / ප්‍රතිඵල
    v. පිළිවෙළ / පිළිවෙල/ පිලිවෙළ (ලකුණු 05)

    ආ) පහත සඳහන් පදවලට සමානාර්ථ පද දෙක බැගින් ලියන්න.
    i. ඇස, ii.ආදරය, iii.මුහුද, iv.කාන්තාව, v.මුහුණ

    (ලකුණු 05)

    ඇ) දීර්ඝ ඉස්පිල්ල, රකාරාංශය, යංශය, රේඵය, කොම්බුදෙක යෙදෙන වචන දෙක බැගින් ලියන්න. (ලකුණු 05)

04. අ) "ගොවි" ශබ්දය සියලු විභක්තිවල ඒක වචන සහ බහු වචනයෙහි වරනගන්න. (ලකුණු 10)

ආ) නිපාත යනු මොනවාද ? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

05. අ) දී ඇති නාමපද නිවැරදි ව වගු ගත කරන්න.

දුවන්නා, උස, සිරිපාල, වඳුරා, පන්දුව, කිඹුලා, නරඹන්නෝ, සිසිල්, රත්මලාන, දූරකථනය

| ජාති | ද්‍රව්‍ය | ගුණ | ක්‍රියා | සංඥා |
|---|---|---|---|---|
| | | | | |

(ලකුණු 05)

ආ) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

i.යුක්තිය, ii.උසස්, iii.යස, iv.ආරම්භය, v.උත්තීර්ණ

(ලකුණු 05)

ඇ) සුදුසු ක්‍රියාපද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. අපි දිනපතා මෙත් ......................................

ii. නුඹලා සතුටින් ජීවත් ..................................

iii. සාමණේරයන් වහන්සේ බුදුපුදට ..................................

iv. ඈ සිනාමුසු මුහුණින් මදෙස ..........................................

v. සොල්දාදුවෝ සතුරන් .......................................................

(ලකුණු 05)

06. අ) පහත සඳහන් කවිය සම්පූර්ණ කරන්න.

"කෙතෙක් වෙහෙස ලදුවත් සුදනෝ පවර"

...................................................................................................... .............

...................................................................................................... .............

...................................................................................................... ............. (ලකුණු 05)

ආ) එම කවියේ සරලාර්ථය ලියන්න.

(ලකුණු 05)

ඇ) එම කවියේ අර්ථයෙන් ඔබට ලබාගත හැකි ජීවිතාදර්ශය කුමක්ද ?

(ලකුණු 05)

07. "රෝහිණී නවකතාව ඉතිහාස තොරතුරු සපයන කෘතියකි." නිදසුන් සමගින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

08. "කතාමෘතය'' අර්ථවත්, රසවත් කථා සමූහයකින් යුක්ත ග්‍රන්ථයකි. ඔබ සිත්ගත් කථාවක් ඇසුරෙන් එම ප්‍රකාශය තහවුරු කරන්න.

(ලකුණු 15)